# බහු සංස්කෘතික ස්වරූපයක් පවත්නා පාසල්වල ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ ස්වභාවය පිළිබඳ අධ්‍යයනයක්

(කොළඹ දිස්ත්‍රික්කයේ බහු සංස්කෘතික ස්වභාවයක් පවත්නා පාසල් නියැදියක් ඇසුරෙනි)

ලංකා එන්.පී. වෙඩිකන්දගේ
(B.Ed., M.Ed.)

UCLIB
551106

කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කෙරෙන ස්වාධීන නිබන්ධය

අධ්‍යාපන පීඨය,
කොළඹ විශ්වවිද්‍යාලය,
කොළඹ 03.
2009 මැයි

## සංක්ෂිප්තය


මෙම අධ්‍යයනයේ ඉලක්කය වූ කලී ශ්‍රී ලංකාවේ බහු සංස්කෘතික ස්වභාවයක් ගන්නා පාසල්වල ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ ස්වරූපය කෙසේද යන්න විමර්ශනය කිරීමයි.

බහු සංස්කෘතික ස්වරූපයක් පවත්නා පාසල්වල සිසුන් අතර අන්‍යෝන්‍ය ක්‍රියාකාරිත්වය හා සුහදතාව පිළිබඳව විමසා බැලීම, බහු සංස්කෘතික තත්ත්වය ආරක්ෂා වන පරිදි පාසල් පෙළ පොත් දායක වන ආකාරය විමසා බැලීම, විෂය සමගාමී ක්‍රියාකාරකම් බහු සංස්කෘතික තත්ත්වය කෙරෙහි බලපාන ආකාරය විමසා බැලීම, බහු සංස්කෘතික ස්වරූපයක් පවත්නා පාසල්වල සිසුන්ගේ විෂය සාධන විෂමතාව පිළිබඳ විමසා බැලීම, බහු සංස්කෘතික පංති කාමරයක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය හා සම්බන්ධ ගැටලු විමසා බැලීම, බහු සංස්කෘතික පංති කාමරයක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සම්බන්ධව ගුරුවරුන්ගේ හා සිසුන්ගේ ආකල්ප විමසා බැලීම අධ්‍යයනයේ අරමුණු වෙයි.

පර්යේෂණ සාහිත්‍ය විමර්ශනය මගින් ප්‍රකට වූයේ බහු සංස්කෘතික අධ්‍යාපනය හා සම්බන්ධ විශාල පර්යේෂණ සංඛ්‍යාවක් බහු සංස්කෘතික පාසලේ ගුරුවරුන්, විදුහල්පතිවරුන්, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය, පාසල් පරිසරයේ බලපෑම, විෂයමාලාව, සිසු සහයෝගිතාව, ශිෂ්‍ය සාධනය, පෙළපොත්වල දායකත්වය, සිසු වෘත්තිමය අවශ්‍යතාවන්, සිසුන්ගේ අධ්‍යාපනය සඳහා පවුලේ දායකත්වය හා බහු සංස්කෘතික අධ්‍යාපනයේ පවතින ගැටලු ආදිය මුල් කරගෙන බටහිර රටවල් විසින් සිදු කර ඇති බවකි. දේශීය වශයෙන් මෙම ක්ෂේත්‍රය සම්බන්ධ පර්යේෂණ සිදු වී ඇත්තේ ඉතා සීමිත සංඛ්‍යාවක් පමණි.

කොළඹ දිස්ත්‍රික්කයේ පිහිටි සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපන කටයුතු මෙහෙයවන බහු සංස්කෘතික ස්වභාවයක් පවත්නා පාසල් සඳහා පමණක් මෙම අධ්‍යයනය සීමා විය. නියැදිය ලෙස එයින් පාසල් 10 ක් තෝරාගනු ලැබීය. මෙම අධ්‍යයනය සඳහා නියැදි සමීක්ෂණ පර්යේෂණ ප්‍රවේශය උපයෝගී කොට ගන්නා ලදී. තොරතුරු ලබා ගැනීමට නියැදියට අයත් පාසල්වල සේවය කරන විදුහල්පතිවරුන්, ගුරුවරුන්, එම පාසලට සම්බන්ධ දෙමාපියන් හා සිසුන් අහඹු සහ සහේතුක නියැදුම් ක්‍රම භාවිතයෙන් තෝරා ගනු ලැබීය. සම්මුඛ සාකච්ඡා, ප්‍රශ්නාවලි, ආකල්ප පරීක්ෂණ සහ නිරීක්ෂණ භාවිතයෙන් ඔවුන් වෙතින් තොරතුරු රැස් කරන ලදී.

රැස් කරන ලද දත්ත, ප්‍රතිශත, වගු, ප්‍රස්තාර සහ සරල සංඛ්‍යාන ක්‍රම භාවිතයෙන් විශ්ලේෂණය හා අර්ථකථනය කරන ලදී.

මෙම අධ්‍යයනයේ අනාවරණ වශයෙන් බහු සංස්කෘතික ස්වරූපයක් පවත්නා පාසල්වල සිසුන් අතර අන්‍යෝන්‍ය ක්‍රියාකාරිත්වය ඉහළ තත්ත්වයක පවතින බවත්, බහු සංස්කෘතික තත්ත්වය ආරක්ෂා වීම සඳහා පාසල් පෙළ පොත් දක්වන දායකත්වය, පහළ මට්ටමක දක්නට ලැබුණත් 9 ශ්‍රේණියේ පෙළ පොත් අතරින් සමහර විෂයයන් සඳහා ලබා දී ඇති පෙළ පොත් මගින් බහු සංස්කෘතික තත්ත්වය ආරක්ෂා වීම සඳහා විශාල පිටිවහලක් ලැබෙන බවත් හඳුනා ගන්නා ලදී. එසේම විෂය සමගාමී ක්‍රියාකාරකම් බහු සංස්කෘතික තත්ත්වය කෙරෙහි විවිධ අයුරින් බලපාන බවත් විෂය සාධනය ගත් විට ඉංග්‍රීසි විෂය හැරෙන්නට අනෙකුත් සියලුම විෂයයන් තුළින් සිංහල බෞද්ධ සිසුන් ඉදිරියෙන් සිටින බවත්, බහු සංස්කෘතික පාසලේ දැනට පවත්නා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා ගුරුවරුන්ගේ සහ සිසුන්ගේ ධනාත්මක ආකල්ප පවතින බවත් හඳුනා ගන්නා ලදී. එසේම මෙම අධ්‍යයනයෙන් භාෂා ගැටලු ඇතුළු ගැටලු රාශියක් ගුරු සිසු දෙපක්ෂයටම පවතින බව ද අනාවරණය විය.

ඉහත සඳහන් කළ අනාවරණ අනුව ශ්‍රී ලංකාවේ ඇති බහු සංස්කෘතික ස්වභාවයක් ගන්නා පාසල්වල ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ සංවර්ධනය සඳහා යෝජනා ද ඉදිරිපත් කරන ලදී. ඒ අනුව මෙවැනි පාසල් සඳහා සුදුසු ඉගැන්වීමේ ක්‍රමයක් ලෙස කණ්ඩායම් ඉගැන්වීම සුදුසු බව ද පාසලේ පැවැත්වෙන සමිති සමාගම් සඳහා බහු සංස්කෘති නියෝජනය වන අංග ඇතුලත් විය යුතු බව ද එසේම පෙළ පොත් තුළට බහු සංස්කෘතික සමාජයක ජීවත්වන විට තිබිය යුතු දැනුම, ආකල්ප වර්ධනය වන පාඩම් ඇතුලත් කිරීමට ද උදෑසන රැස්වීම සඳහා සියලු ආගම්වලට අවස්ථාව ලබා දීමට ද පාසල තුළ විවිධ ආගමික හා ජාතික උත්සව භේදයකින් තොරව සැමරීමට අවස්ථාව ලබා දීමට ද සිංහල නොවන ජන වර්ගවලට අයත් සිසුන්ගේ ක්‍රීඩා හා නායකත්ව කටයුතු සඳහා සහභාගිත්වය වැඩි කිරීමට, භාෂා දුර්වලතා අවම කිරීමට හා විෂය සාධනය ඉහළ දැමීමට ක්‍රම සකස් කිරීමට ද තමන් කැමති ආගමක් ඉගෙනීමට අවස්ථාව ලබා දීමට ද බහු සංස්කෘතික අධ්‍යාපනය සඳහා ගුරු පුහුණුවක් ලබා දීමට උචිත බව ද යෝජනා කෙරිණි.

ශ්‍රී ලංකාවේ පවතින සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලබා දෙන බහු සංස්කෘතික ස්වභාවයක් ගන්නා පාසල්වල ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථක කර ගැනීමටත්, ශ්‍රී ලංකාවේ පවතින බහු සංස්කෘතික ස්වභාවයක් ගන්නා පාසල් සම්බන්ධයෙන් තීරණ ගන්නා වුත්, එයට සම්බන්ධිත වූත් සියලු දෙනාම මෙම අධ්‍යයනයෙන් ලැබෙන අනාවරණ ප්‍රයෝජනවත් වන බව නොඅනුමානය.

# ABSTRACT


The aim of the present research is to investigate into the nature of teaching learning process in the schools of multicultural background in Sri Lanka.

The objectives of the research under the aims stated above, is to the investigate the interpersonal relationships among students from the schools of multicultural background, study the contribution of the school text books towards retention of the multicultural nature of such schools, study the influence of the co-curricular activities on the retention of the multicultural nature, study the performance disparities among students from schools of multicultural background, investigate the attitudes of teachers and students about the teaching learning process in multicultural class room, and identify the problems associated with the schools of multicultural backgrounds.

According to the analysis of the literature, it is obvious that large number of research related to the multicultural education have been carried out by the western countries based on school principals and teachers, teaching learning process, effect of the school environment, curriculum, interpersonal relationships among students text books, vocational requirements of students, contribution of the families for the education of students, and the issues existing in the multicultural education.

The study was limited only for the schools at Colombo district which have the multicultural nature and educational activities are conducted in Sinhala medium. Ten (10) schools from among them were selected as the sample and the sample Survey Research Approach was used as the research tools. Information for the study was collected from principals of the 10 schools, students, teachers and parents of the children of the schools, using the Random Sample Survey and attitude tests methods. Information was collected through questionnaires, attitude tests, interviews and observations.

Finally the data thus collected were analyzed and interpreted using percentages tables, graphs and simple statistical methods.

The findings of the research were: that the interpersonal relationships among the students of the schools of multicultural background were at high level and although the contribution of the text books for the protection of the multicultural nature was at low level, out of the grade 9 text books, some of the text books given for certain subjects have contributed in a long way to protect the multicultural nature as the conclusion of this study. It has been observed, co curricular activities also affect various ways on the stage of multicultural states and from the subject field except English, from all other subjects, Sinhala, Buddhist students were at the top level. Teachers and students have positive attitudes for the learning teaching process at the multicultural schools. Further, it has been cleared by the study that there were number of issues including language problem for the teachers as well as students.

Based on the findings mentioned earlier, the following recommendations are made on the teaching – learning process in schools with multicultural backgrounds, such as learning in groups is more desirable in a multicultural atmosphere, multicultural participation in school clubs, societies should be encouraged, text books should include material which promote attitudes and tolerance necessary to live in harmoniously in a multicultural set up, school assemblies should promote the participation of students of all religions on a regular basis. The participation of non Sinhala students in sports and leadership promotion activities should also be encouraged while students should be given the opportunity to study their own religion. To achieve all this it is felt that the teachers and principals should be adequate trained to work in a multicultural atmosphere.

It is obvious that the results of the study will be definitely helpful to all decisions makers and others related to that, regarding multicultural schools in Sri Lanka and also to success the learning teaching process within the multicultural schools where the education is giving in Sinhala medium.